# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2190/17 - 2020 අගෝස්තු මස 24 වැනි සඳුදා - 2020.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ජනාධිපති විධානය

1. පුරාවිද්‍යා චක්‍රවර්තී පූජ්‍ය එල්ලාවල මේධානන්ද නායක ස්වාමීන් වහන්සේ

2. උතුර සහ නැගෙනහිර දෙපළාතේ සහ තමන්කඩුව දිශාවේ ප්‍රධාන සංඝනායක
   අරිසිමලේ ආරණ්‍ය සේනාසනාධිපති පූජ්‍ය පනාමුරේ තිලකවංශ නායක ස්වාමීන් වහන්සේ

3. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
   ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

4. ආචාර්ය සෙනරත් බණ්ඩාර දිසානායක මැතිතුමා
   පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

5. චන්ද්‍රා හේරත් මැතිතුමිය
   ඉඩම් කොමසාරිස් ජනරාල්

6. ඒ.එල්.එස්.සී. පෙරේරා මැතිතුමිය
   මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව

7. මහාචාර්ය රාජ් කුමාර් සෝමදේව මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැළණිය විශ්වවිද්‍යාලය

8. මහාචාර්ය කපිල ගුණවර්ධන මැතිතුමා
   පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෛද්‍ය පීඨය

1A - G 32746 — 386 (2020/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

9. දේශබන්දු තෙන්නකෝන් මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, බස්නාහිර පළාත

10. එච්.ඊ .එම්.ඩබ්ලිව්.ජී. දිසානායක මැතිතුමා
    පළාත් ඉඩම් කොමසාරිස්, නැගෙනහිර පළාත

11. දිලිත් ජයවීර මැතිතුමා
    සභාපති, දෙරණ මාධ්‍ය ජාලය

12. රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2020.06.01 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුමයන් බොහොමයක්, බෞද්ධ ආගමික පසුබිම මත හා එම සිද්ධස්ථාන ආශ්‍රිතව පවතින බැවින්, එම උරුමයන් හඳුනාගැනීමේ දී හා කළමනාකරණයේ දී ගරුතර මහා සංඝරත්නයේ උපදේශකත්වය හා අනුශාසකත්වය තවදුරටත් අවශ්‍ය බව හඳුනාගෙන ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත නම් සඳහන් භික්ෂූන්වහන්සේලා, උන්වහන්සේලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍ය සහ විශ්වාසවන්තයභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයින් ලෙස මෙයින් පත් කරමි.

1. අස්ගිරි පාර්ශවයේ අතිපූජ්‍ය වෙඬරුවේ ධර්මකීර්ති ශ්‍රී රතනපාල උපාලි අභිධාන අනුනායක ස්වාමීන් වහන්සේ

2. මල්වතු පාර්ශවයේ මහාලේඛකාධිකාරී ආචාර්ය පූජ්‍ය පහමුණේ සුමංගල නායක ස්වාමීන් වහන්සේ

3. අස්ගිරි පාර්ශවයේ මහාලේඛකාධිකාරී ආචාර්ය පූජ්‍ය මැදගම ධම්මානන්ද නායක ස්වාමීන් වහන්සේ

4. මල්වතු පාර්ශවයේ කාරක සංඝ සභික ගෞරව ශාස්ත්‍රවේදී අඹන්වැල්ලේ ශ්‍රී සුමංගල ස්වාමීන් වහන්සේ

වර්ෂ දෙදහස් විස්සක් වූ අගෝස්තු මස 19 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

09 - 190

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.